'ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලයවල විවිධ ආබාධ සහිත සිසුන් සඳහා අධ්‍යාපනය සංවර්ධනය කිරීම' යන ජාත්‍යන්තර ව්‍යාපෘතිය, යුරෝපා සංගමය සම-අරමුදල් සපයන උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ධාරිතා වර්ධන වැඩසටහන යටතේ ආරම්භ කරන ලදි. ආබාධිත සිසුන්ට සමාන අවස්ථාවන් නිර්මාණය කිරීමේ උසස් චේතනාවෙන් එය ආරම්භ කරන ලද්දේ ආබාධිත නොවන පුද්ගලයින් මෙන් ම ඔවුන්ට ද තෘප්තිමත් ජීවිතයක් ගත කිරීම සඳහා අවශ්‍ය මිත්‍රශීලී වාතාවරණයක් නිර්මාණය කිරීම සඳහා ය. ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ මෙවැනි ව්‍යාපෘතියක් සිදුවන පළමු අවස්ථාව ලෙස මෙය සැලකිය හැකිය.

ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ආබාධිත සිසුන් සඳහා මේ වන විටත් ලබා දී ඇති සහයෝගය හඳුනාගත් පේරාදෙණිය විශ්ව විද්‍යාලය, ආබාධිත සිසුන්ට පරිපූර්ණ ජීවිතයක් ගත කිරීම සඳහා පදනමක් නිර්මාණය කිරීමේ අවංක චේතනාවෙන් මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීමට අතීතව මූලිකත්වය ගෙන කටයුතු කළේය.

මෙම ව්‍යාපෘතියේ සම්බන්ධීකාරක ලෙස පේරාදෙණිය විශ්වවිද්‍යාලය කටයුතු කරන අතර එය ශ්‍රී ලංකාවේ සහ යුරෝපයේ තවත් විශ්වවිද්‍යාල හතක් සමඟ එක්ව කටයුතු කරයි.

- රුහුණ විශ්වවිද්‍යාලය
- නැගෙනහිර විශ්වවිද්‍යාලය
- ශ්‍රී ලංකා තාක්ෂණික විශ්වවිද්‍යාලය
- Masaryk University – The Czech Republic
- University of Zagreb – Croatia
- Transylvania University of Brasov – Romania
- Uppsala University – Sweden

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයවල ආබාධ සහිත සිසුන් සඳහා වන අවස්ථා සමාන කිරීම සඳහා ආධාරක ක්‍රමයක් සංවර්ධනය කිරීම වෙනුවෙන් මෙම ව්‍යාපෘතිය උත්සාහ දරනු ලබයි. මෙම ව්‍යාපෘතියේ මූලික පරමාර්ථය වන්නේ, මෙතෙක් බොහෝ උසස් අධ්‍යාපන අවස්ථා අහිමිවෙමින් පැවති ආබාධ සහිත සිසුන්ට, සියලුම ක්ෂේත්‍රයන් වෙත පූර්ණ ලෙස ප්‍රවේශ වීම සඳහා හැකියාව උපරිමයෙන් ලබාදීම යි. මේ හරහා ආබාධිත සිසුන්ගේ උසස් අධ්‍යාපනය ප්‍රවේශය ලබා ගැනීමේ අයිතිය තහවුරු කිරීම, දැනුවත් කිරීම මගින් වෙනස්කම්වලට එරෙහිව නැගී සිටීමට ශක්තිය ලබාදීම සහ ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයවල ආබාධ සහිත සිසුන් සඳහා තිරසාර උපකාරක ජාලයක් ඇති කිරීම සහතික කිරීම සිදු වේ.

මේ අනුව, මෙම ව්‍යාපෘතියේ සංවිධායකයන්ගේ අවංක විශ්වාසය වන්නේ ආබාධිත සිසුන්, ආබාධිත නොවන පුද්ගලයන් සේ ම, ඔවුන්ගේ සිහින දිනාගනිමින්, සමාජයේ වෙනසකින් තොරව හැසිරීමට විශ්වාසය සහ හැකියාව ලබාගන්නා බව යි. ව්‍යාපෘතියේ කාලසීමාව 2020-2023 දක්වා වසර 3 කි.

මෙම සිසුන්ට වෙනසකින් තොරව සැලකීම සඳහා අධ්‍යාපනය සඳහා ඇති ප්‍රවේශයන් ප්‍රවර්ධනය කිරීම හා සංවර්ධනය කිරීමට ප්‍රමුඛතාව දිය යුතුයි යන්න මොවුන්ගේ විශ්වාසය යි. ඔවුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ සම අයිතීන් සහිතව ඔවුන්ව සමාජයේ සවි ගැන්වීම කරා ළඟා වීම ව්‍යාපෘතියේ මූලික වූ ද අවසාන වූ ද පරමාර්ථය යි.

<u>ව්‍යාපෘතියේ අරමුණු</u>

- ආබාධ සහිත සිසුන් සඳහා අංගසම්පූර්ණ ආදර්ශ මධ්‍යස්ථානයක් පිහිටුවීම
- ආබාධ සහිත සිසුන් සඳහා ආධාරක සේවාවක් සංවර්ධනය කිරීම
- හවුල්කාර විශ්වවිද්‍යාලයවල කාර්ය මණ්ඩලය සඳහා දැනුවත්භාවය සහ පුහුණුව ලබාදීමේ වැඩසටහන් පැවැත්වීම
- යුරෝපීය හවුල්කාර විශ්ව විශ්වවිද්‍යාලයවල විශේෂඥතාව සහ දැනුම දේශීය විශ්වවිද්‍යාලයවල කාර්ය මණ්ඩලය හා හුවමාරු කරගැනීමට අවස්ථාව සැලසීම
- ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයවල තුළ ප්‍රතිපත්ති සැකසීම සහ නිර්දේශ ක්‍රියාත්මක කිරීම
- පර්යේෂණ මගින් සොයාගත් තොරතුරු ප්‍රකාශයට පත් කිරීම

<u>ව්‍යාපෘතියේ ප්‍රධාන ක්‍රියාකාරකම්</u>

- තක්සේරු සමීක්ෂණයන් සිදු කිරීම
- පුහුණුකරුවන් පුහුණු කිරීම
- අධ්‍යයන / අනධ්‍යයන කාර්ය මණ්ඩලවල දැනුවත්භාවය සහ ධාරිතාව වර්ධනය
- ඉගෙනුම් ආධාරක සහ උපකාරක තාක්ෂණික උපකරණ සැපයීම